කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

# ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2017/2018

## SOC 1101 - සමාජ විද්‍යාවේ මූලිකාංග

පැ දෙකයි (02)

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

---

1.

i. යථානුභූතවාදය යනු කුමක්ද? (ලකුණු 2)

ii. සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ සහ අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාව මතු කළ ඓතිහාසික සිදුවීම් මොනවාද? (ලකුණු 3)

iii. සමාජය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයේදී විෂයානුබද්ධ බව (objectivity) සහ පුද්ගල නිශ්‍රිත බව (subjectivity) පිළිබඳ සංකල්ප අදාල වන්නේ කෙසේද? (ලකුණු 10)

2.

i. පන්ති ගැටුම යනු කුමක්ද? (ලකුණු 2)

ii. කාල් මාක්ස් විස්තර කළ ආකාරයට අධෝ ව්‍යුහය සහ උපරි ව්‍යුහය යන සංකල්පවලින් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 3)

iii. පීඩකයා සහ පීඩිතයා අතර ඇති සමාජ සම්බන්ධතාව පන්ති විරහිත මනෝරාජික සමාජයක් පිළිබඳ අදහස සමඟ කාල් මාක්ස් සම්බන්ධ කරන්නේ කෙසේද? (ලකුණු 10)

3.

i. 'සමාජ විද්‍යාත්මක දැනුම විද්‍යාත්මක වේ.' යන ප්‍රකාශය පැහැදිලි කරන්න.(ලකුණු 2)

ii. විද්‍යාත්මක ක්‍රමයේ පියවර කෙටියෙන් දක්වන්න. (ලකුණු 3)

iii. ඔබට කොළඹ නගරයේ වෙසෙන ලිංගික ශ්‍රමිකයන් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් කිරීමට අවශ්‍යයැයි සිතන්න. ඔබ ඒ සඳහා තෝරා ගන්නේ ප්‍රමාණාත්මක අධ්‍යයනයක්ද, ගුණාත්මක අධ්‍යයනයක්ද නැතහොත් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දෙකෙහි සංකලනයක්ද? ඔබගේ තීරණයට හේතු විස්තර කරන්න. (ලකුණු 10)

4.

i. සමාජ සමූහයක් යනු කුමක්ද? (ලකුණු 2)

ii. සමාජ සමූහ පිළිබඳ අධ්‍යයනය සමාජ විද්‍යාඥයාට වැදගත් වන්නේ මන්ද? (ලකුණු 3)

iii. පුද්ගලයකුගේ සමාජානුයෝජනයෙහි ලා වඩා වැදගත් වන්නේ ඔහු/ඇය අයත් වන ප්‍රාථමික සමූහද නැතහොත් ද්විතීයික සමූහද? උදාහරණ දක්වමින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 10)

5.

i. විධිමත් සමාජ සංවිධානයක් යනු කුමක්ද? (ලකුණු 2)

ii. 'තාර්කිකත්වය සඳහා නූතන මිනිසා සතු හැකියාව පෙන්නුම් කෙරෙන හොඳම උදාහරණය ලෙස මැක්ස් වෙබර් නිලබලවාදය හඳුනා ගත්තේය.' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 3)

iii. විශ්ව විද්‍යාලය තුළ ඔබගේ භූමිකාව සාර්ථකව ඉටු කිරීම සඳහා විශ්ව විද්‍යාලය නැමැති විධිමත් සංවිධානය තුළ ඇති අවිධිමත් සංවිධාන ඔබට උපකාරී වන්නේ කෙසේද? උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

6.

i. ආගම යනු කුමක්ද? (ලකුණු 2)

ii. සමාජ ඒකාබද්ධතාව ගොඩනැඟීමෙහි ලා ආගමේ කාර්යභාරය එමිල් ඩර්කයිම් විස්තර කළේ කෙසේද? (ලකුණු 3)

iii. තාර්කික සහ විද්‍යාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයා සහ ආගම අතර සම්බන්ධතාව වෙනස් වී ඇතැයි ඔබ සිතන්නේද? උදාහරණ දක්වමින් ඔබගේ පිළිතුර විචාරාත්මකව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

7.

i. සමාජ ස්ථරායනය යනු කුමක්ද? (ලකුණු 2)

ii. ස්ථර උපසංස්කෘති යන සංකල්පය උදාහරණ ඇසුරින් පහදන්න. (ලකුණු 3)

iii. ඔබ අයත් වන විවිධ සමාජ ස්ථරායන පද්ධති මොනවාද? විශ්ව විද්‍යාල උපාධියක් ලබා ගැනීම එම පද්ධති තුළ සමාජ චලනතාව සඳහා ඇති ඉඩකඩ කෙරෙහි බලපාන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 10)

8. පහත සඳහන් සමාජ විද්‍යාත්මක සංකල්ප උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

   i. අරමුණක් හා සම්බන්ධ තාර්කික ක්‍රියාව (rational action in relation to a goal) සහ අගයයක් හා සම්බන්ධ තාර්කික ක්‍රියාව (rational action in relation to a value) (ලකුණු 3)

   ii. අහඹු (accidental) සහ සැළසුම් කරන (regulated) ලද සමාජ අන්තර්ක්‍රියා (ලකුණු 3)

   iii. ආරෝපිත (ascribed) සහ සාධිත (achieved) සමාජ තත්වය (ලකුණු 3)

   iv. සමාජ ව්‍යුහය (social structure) සහ සමාජ සම්බන්ධතා (social relations) (ලකුණු 3)

   v. ධනාත්මක (positive) සහ සෘණාත්මක (negative) සමාජානුයෝජනය (ලකුණු 3)

*******************************